**ශීර්ෂය 23 - විගණන සේවා කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය ශීර්ෂය 23 දරන විගණන සේවා කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 23 - විගණන සේවා කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.6 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම.<br><br>(දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | 1. ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2.2 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරිම. | 2.3 |
| | | 3.සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම. | 2.4 (අ) |
| | | 4. අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.4 (ආ) |
| | | 5. විගණන හා කළමනාකරණ කමිටුව | 2.6 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරයන්

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින් පත් කිරීම, උසස් කිරීම , මාරු කිරීම, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමට අදාළ රීති සකස් කිරීමේ බලය

(ආ) ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම.

### 2.2 සැලැසුම් කිරිම.

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබාගැනීම**

**ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

විගණන සේවා කොමිෂන් සභාව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබාගැනීම සඳහා රු. මිලියන 2.7 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 1.8 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අදියර යටතේ පහත සඳහන් සැලැසුම් හා ලියකියවිලි පිළියෙල කර නොතිබුණි.

(අ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම

(ආ) වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම

(ඇ) එකිනෙක කොන්ත්‍රාත් පැකේජ සහ ප්‍රසම්පාදන කාල උපලේඛනය (ප්‍ර.කා.උ)

(ඈ) වැඩ, භාණ්ඩ සහ සේවා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම

**2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම.**

විගණන සේවා කොමිෂන් සභාව 2016 වර්ෂයේදී ශීර්ෂ අංක 21 විගණකාධිපති දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වී 2017 වර්ෂයේදී ශීර්ෂ අංක 23 යටතේ වෙනම ම ශීර්ෂයක් ලෙස ක්‍රියාත්මක විය. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයක කාලය තුළ කොමිෂන් සභාවට සලසා තිබුණු ප්‍රතිපාදනය , උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2017 | පුනරාවර්තන | 52.23 | 27.40 | 24.84 | 47.56 |
| | මුලධන | 2.80 | 1.10 | 1.70 | 60.71 |
| | **එකතුව** | **55.03** | **28.50** | **26.54** | **48.23** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විසර්ජන ගිණුම**

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 2.55ක් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධිප්‍රතිපාදන සලසා දීම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 55.03 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 28.50 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 26.54 ක් හෙවත් සියයට 48.23 ක් ඉතිරි වී තිබුණි. ජාතික විගණන පනත නියමිත පරිදි සම්මත වී නොතිබීම මේ සඳහා හේතු වී තිබුණි.

## 2.5 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය වෙනුවෙන් රු.55,407,454 ක ප්‍රතිපාදන වැය දැරීම සඳහා සැලසුම් කර තිබුණද, ජාතික විගණන පණත නියමිත පරිදි සම්මත නොවීම නිසා කොමිෂන් සභාව ක්‍රියාත්මක වීමට බාධාවන් පැවතීම හේතුවෙන් රු.28,490,070 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 51.42 ක් බව නිරීක්ෂණය විය.

## 2.6 විගණන හා කළමනාකරණ කමිටුව

2016 ජනවාරි 28 දින අංක DMA/2009 (I) (i) දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛයෙන් සංශෝධිත 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 ( I ) කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභාව විසින් විගණන හා කළමණාකරණ කමිටු ස්ථාපිත කළ යුතු වුවද , 2017 වර්ෂයේ විගණන හා කළමණාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු හා කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කොමිෂන් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 14.40 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.685,657 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 10 | 02 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 02 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 16 | 07 | 09 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 10 | 02 |
| | එකතුව | 43 | 21 | 22 |

ජාතික විගණන පනත සම්මත නොවීම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා ඇති ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම මත මෙම පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමේ අවශ්‍යතාවයක් පැන නැගී නොතිබුණි.